# ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

ශ්‍රී පාලි මණ්ඩපයෙහි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් 2025 ඔක්තෝම්බර් මස 27 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. <u>තාක්ෂණික නිලධාරී (තොරතුරු තාක්ෂණ) III ශ්‍රේණිය</u>

සුදුසුකම් :

(i). අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙහි ඕනෑම විෂය ධාරාවක් යටතේ එක වරකදී විෂයයන් තුනක් සමත්ව තිබිය යුතුය.

සහ

(ii). තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් හෝ තොරතුරු සන්නිවේදනය හා බහු මාධ්‍ය තාක්ෂණ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ / තොරතුරු තාක්ෂණ යන ක්ෂේත්‍රයකට අදාලව පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ National Vocational Qualification 5 වෙනි මට්ටමට නොඅඩු නිපුණතා සහතික පත් හෝ වෙනත් සමාන සුදුසුකමක් ලබා තිබීම.

සටහන :
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාල රැකියා පළපුරුද්දක් සහිත අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් පරිමාණය : U – MT1(III ) - රු.51,095–7x540;10x640- 60,575/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක් හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

https://forms.gle/ELRc7g4tzLu666icA

හෝ

https://drive.google.com/drive/folders/1__0xRGGu8l1k6eIHbtYzVoEeWITdUVHn?usp=drive_link

02 <u>තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය</u>

සුදුසුකම් :

(i). අ.පො.ස.(උසස් පෙළ) විභාගයෙහි ඕනෑම විෂය ධාරාවක් යටතේ එක වරකදී විෂයයන් තුනක් සමත්ව තිබිය යුතුය.

සහ

(ii). (අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික /බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාලව ජාතික වෘත්තීය නිපුනතා (National Vocational Qualification) 5 වෙනි මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුනතා සහතිකපත් ලබා තිබීම.

හෝ

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ඉහත (2) (අ) කොටසෙහි සුදුසුකම් වලට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ / ඉලෙක්ට්‍රොනික / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාලව ලබා ගත් තාක්ෂණික සුදුසුකම් සමග පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : : U – MT1(III ) - රු.51,095–7x540;10x640- 60,575/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය **:** ලිඛිත පරීක්ෂණයක් හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**https://forms.gle/oCmbq7ws7e7Tnv3m8**

හෝ

https://drive.google.com/drive/folders/1__0xRGGu8l1k6eIHbtYzVoEeWITdUVHn?usp=drive_link

03. බංගලා භාරකරු හා අරක්කැමි (III ශ්‍රේණිය)

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කල යුතුය).

හෝ

2. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය : U – PL 2(III ) - රු.44,575–16x490- 52,415/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය **:** වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**https://forms.gle/k3QT1fPa8net9VNx5**

හෝ

https://drive.google.com/drive/folders/1__0xRGGu8l1k6eIHbtYzVoEeWITdUVHn?usp=drive_link

04 . රියදුරු (III ශ්‍රේණිය)

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම

සහ

2. බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්දක් ලබා තිබිය යුතුය.

වැටුප් පරිමාණය :U – PL 3(III ) - රු.48,005–16x490- 55,845/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්
https://drive.google.com/drive/folders/1__0xRGGu8l1k6eIHbtYzVoEeWITdUVHn?usp=drive_link

05. වැඩ සහායක (III ශ්‍රේණිය)

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම

වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වෙනත් : සෑම අයදුම්කරුවකුම,

අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආ) තනතුරේ කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය විය යුතුය.

ඇ) මනා චරිතයකින් යුතු විය යුතුය.

වැටුප් පරිමාණය :U – PL 1(III ) - රු.42,775–16x450- 49,975/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්
https://drive.google.com/drive/folders/1__0xRGGu8l1k6eIHbtYzVoEeWITdUVHn?usp=drive_link

06. වඩු කාර්මික (කොන්ත්‍රාත් පදනම)

සුදුසුකම් : තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 4 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

මාසික වැටුප : රු.48,005/- + රු.17,800/- (ජීවන වියදම් දීමනාව ) +
රු.5,000/-(රජය අනුමත දිමනාව ) +ETF+UPF

පැවරුම් කාලය : අවුරුදු 01

බඳවා ගන්නා ක්‍රමය :වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින්
https://forms.gle/u31FNHmjnn5xTCbm9
හෝ
https://drive.google.com/drive/folders/1__0xRGGu8l1k6eIHbtYzVoEeWITdUVHn?usp=drive_link

**පොදු කරුණු - සියලුම තනතුරු සඳහා වයස අවුරුදු 18 - 45 අතර වියයුතුය**

ඉහත තනතුරු සඳහා වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ ඊට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ. තෝරාගත් අපේක්ෂකයා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයෙකු වනු ඇත. ඔහු/ඇය තම මාසික වැටුපෙන් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වන අතර ඒ සමඟම, සේවා යෝජකයා විසින් සේවකයාගේ වැටුපෙන් 15%කට සමාන මුළු දායකත්වයක් ලබා දෙනු ඇත. (6 වන තනතුර හැර අනෙක් තනතුරු සඳහා එයින් 8%ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට සහ 7%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කෙරේ). 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් 3%ක් සේවක භාර අරමුදලට දායක වේ.

අයදුම් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් ශ්‍රී පාලි මණ්ඩප වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය. **(https://spc.cmb.ac.lk/)** සියලුම අයදුම්පත් ඉහත සබැඳිය යටතේ ඇති ගූගල් පෝරමය පුරවා ඉදිරිපත් කළ යුතුය.

ගූගල් පෝරමය ඉදිරිපත් කිරීමෙන් පසුව අයදුම්කරුගේ විද්‍යුත් තැපෑලට ලැබෙන **PDF** ලේඛනයේ දෘඩ පිටපතක් අයදුම්කරුගේ අත්සන සහිතව එවීම **අනිවාර්ය** වන අතර දෘඩ පිටපත ඉදිරිපත් නොකිරීම තේරීම් ක්‍රියාවලියෙන් නුසුදුස්සකු වීමට හේතු වේ. අයදුම්කරු දැනට උසස් අධ්‍යාපන ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක සේවය කරන්නේ නම්, ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ද අයදුම්පතට ඇතුළත් කළ යුතුය.

ඊට අමතරව අදාළ අධ්‍යාපනික, වෘත්තීය, විෂය බාහිර සහ සේවා සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කරන ලද පිටපත්ද ඉහත සඳහන් කරන ලද අයදුම්පතට අමුණා **නියෝජ්‍ය ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ** වෙත **2025.10.27** දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. **අසම්පූර්ණ අතින් ලියන ලද සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සත්‍ය පිටපත් බවට සහතික කරන ලද පිටපත් අමුණා නොමැති සහ ආකෘති පත්‍ර භාවිතයෙන් ඉදිරිපත් කරන ලද හෝ අයදුම්පත් කැඳවන අවසන් දිනට පසුව ලැබෙන** අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් කිසිඳු තත්ත්වයක් යටතේ නැවත සලකා බලනු නොලැබේ.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ/හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් එම ආයතනවල ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතු අතර ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ශ්‍රී පාලි මණ්ඩපය
ලේඛකාධිකාරී වෙනුවට

10.10.2025